www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මහාචාර්ය ජෙෆ්රි ස්වේන්ගේ ලිපියක් සහ ඩේවිඩ් නෝර්ත්ගෙන් පිලිතුරක්

## A letter from Professor Geoffrey Swain and a reply by David North

**2007 මැයි 19**

*ඉයන් තැචර් හා ජෙෆ්රි ස්වේන් යන මහාචාර්යවරුන් විසින් රචිත ලියොන් ට්‍රොට්ස්කිගේ චරිතාපදාන දෙක ගැන ඩේවිඩ් නෝර්ත් කල විවේචනාත්මක විචාරයට පිලිතුරු දෙන ලෙස ලෝක සමාජවාදී වෙබ් අඩවිය ඔවුන් දෙදෙනාට ආරාධනා කලේ ය. මැයි 10 දා ලෝක සමාජවාදී වෙබ් අඩවියට මහාචාර්ය ස්වේන්ගෙන් ලිපියක් ලැබුනි. එම ලිපියත් නෝර්ත් එයට යැවූ පිලිතුරත් අපි පහත පල කරමු. ඉයන් තැචර්ගෙන් කිසිදු ලිපියක් ලැබී නැත.*

හිතවත් ඩේවිඩ් නෝර්ත්,

ඉතිහාසය තුල ට්‍රොට්ස්කි දරන තැන ගැන කරන තක්සේරුවේ දී අප අතර එකඟත්වයක් නැති බව පැහැදිලි ය. ඔබගේ ලිපියේ සඳහන් එක් කාරනාත්මක දෝෂයක් නිවැරදි කර ගැනීමට සමහර විට ඔබ කැමතිවනු ඇතැයි සිතමි. මා ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයට බැඳුනේ පසුගිය වර්ෂයේ දී ය. එහෙයින් ජේම්ස් වයිට්ගේ දිගුකාලීන සහකරුවෙක් නොවෙමි.

ට්‍රොට්ස්කිගේ චරිතාපදානය ලිවීමේ දී මාගේ අරමුන වූයේ තරුනයන්ගේ ඔලු "බුද්ධිමය වසයෙන් නොමග යවන විකාරයන්ගෙන් පුරවා දැමීම නොවේ. සරලව ම එකිනෙකට වෙනස් ට්‍රොට්ස්කිලා දෙන්නෙක් - 1917ට පෙර සමයේ ලෙනින්ගේ විවේචකයා සහ 1917ට පසු අවුරුදුවල "හොඳම ලෙනින්වාදියා" යනුවෙන් - යයි පෙනීයන ගැටලුව විසඳලීමට ය. මෙය වනාහී මට නිරතුරුව ම සිත් කරදර දුන් කාරනයක් විය. ලෝන්ග්මන් ප්‍රකාශකයන්ගෙන් ලද්දා වූ ආරාධනය මෙය ගැන තව දුරටත් කල්පනා කිරීමට මට අවස්ථාවක් ලබා දුනි. විශේෂයෙන් ඔවුන්ට අවශ්‍යව තිබුනේ " බලයේ පැතිකඩ" නම් ඔවුන්ගේ ග්‍රන්ථ මාලාවට ගැලපෙන පරිදි ට්‍රොට්ස්කි තමාගේ බලයේ මුදුන්පෙත්තේ දී විස්තර කල කෘතියක් හෙයින් මා යොදා ගත් මූලාශ්‍රයන් පිලිබිඹු කරන්නේ එයයි. සිවිල් යුද්ධය පිලිබඳ පරිච්ඡේදය සඳහා බොහෝ කරුනු රාජ්‍ය ලේඛනාගාරවලින් සොයාගත් ඒවා ය. එහෙත් එක්සත් ජනපදය තුල ගොනු කරගෙන ඇත්තා වූද (මගේ ලිපිය තුල පිටපත් කොට නැත්තා වූද) කරුනු බොහෝසෙයින් අදාල වන්නේ ට්‍රොට්ස්කිගේ පිටුවහල් ජීවිතයට ය.

ඔබේ විවේචන බොහොමයක් අදාලවන්නේ ට්‍රොට්ස්කි ස්ටැලින් හා ගැටුනු කාල පරිච්ඡේදයට ය. ඔබත් මමත් දේවල් දකින්නේ බෙහෙවින් වෙනස් ආකාරයකට ය. එහෙත් මා නිතරම ස්ටැලින් ආරක්ෂා කරන්නේ ය යන්නට මම එකඟ නොවෙමි. - මා තහවුරු කරන්නට උත්සාහ කරන එකම දෙය නම් තර්මිඩෝරය වනාහී යථාර්ථය තුල මුල් බැසගත් සංකල්පයක් නුවූ බව ය; එසේ නිගමනය කිරීම නිසා ට්‍රොට්ස්කිගේ තත්වය සැලකිය යුතු ලෙස දුර්වල වූ බව ය.

විප්ලවයන් අතර කාල පරිච්ඡේදය ද විප්ලවය ම ද සිවිල් යුද්ධය ද පිලිබඳ මගේ කරුනු දැක්වීම ගැන ඔබ කියන්නේ ඉතා ස්වල්පයකි. මේ සම්පූර්න කාල පරිච්ඡේදයන් තුල මා උත්සාහ කලේ ට්‍රොට්ස්කි ඉතිහාසයේ ප්‍රථම සාර්ථක සමාජවාදී විප්ලවයේ නිර්මාන ශිල්පියා ලෙස සහ අන් කවරකුට ද වඩා කම්කරු පන්ති සටන්කරුවන් අතර සහායක් ගොඩනගාගැනීමට සමත් වූ රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදියා ලෙසට ඉදිරිපත් කිරීමට ය.

ට්‍රොට්ස්කිගෙන් තොරව ඔක්තෝබර් විප්ලවයක් සිදු නොවනු ඇත; රුසියානු විප්ලවයේ දී බොල්ශෙවික් ජයග්‍රහනයක් සිදු නොවනු ද ඇත. ශිෂ්‍යයන්ට ඉගැන්වීමට මට උවමනා වූයේ එයයි. සහතිකෙන්ම අප දෙදෙනාට මේ ගැන එකඟ විය හැකි ය. එහෙත් ස්ටැලින් කල්ලිය පමනක් නොව බොහෝ බොල්ශෙවිකයන් ද විශ්වාස කල පරිදි 1917ට පෙර සමයේ ට්‍රොට්ස්කි දරා සිටි මෙන්ශෙවික්වාදය පක්ෂ නායකත්වය සඳහා ඔහු කල අභියෝගයට බාධාවක් වීය යන්න ගැන නම් කවර කලෙකත් අප දෙදෙනාට එකඟ විය නොහැකි වනු ඇත.

***

හිතවත් මහාචාර්ය ස්වේන්,

මැයි 10 දින දරන ඔබගේ ලිපිය ගැන ස්තුතිවන්ත වෙමි. අවාසනාවකට මෙන් අපගේ මතභේදයෝ ඉතිහාසය තුල ට්‍රොට්ස්කිට අයිති තැන පිලිබඳව ප්‍රතිවිරුද්ධ ඇගයුම්වලට වඩා බොහෝ දුර දිග යති. ඔබ විසින් ද ඉයන් තැචර් විසින් ද රචිත ලියොන් ට්‍රොට්ස්කි පිලිබඳ චරිතාපදානයන් ගැන මගේ ප්‍රධාන විවේචනය වන්නේ ඒවා ලිපිලේඛන සහිතව

මැනවින් ඔප්පු කරන ලද කාරනා සාවද්‍ය ලෙස ඉදිරිපත් කිරීම ද විකෘත කිරීම ද පිලිබඳව ය. ඔබගේ අර්ථකථනය වර්ධන කරනු ලැබ ඇත්තේ ඉතිහාස වාර්තාව බරපතල ලෙස වැරදි ලෙස කියවීමේ ද වැරදි ලෙස ඉදිරිපත් කිරීමෙන් පමනක් නොව දැනුවත් ව මුසාකරනය කිරීමෙන් ද වේ. මේ පිලිබඳ උදාහරන ලෙස මගේ විමර්ශනය ඔබගේ පහත සඳහන් අභ්‍යර්ථනයන් ඉදිරිපත් කලේ ය. (අ) ලෝක විප්ලවය පිලිබඳ ට්‍රොට්ස්කිගේ විශ්වාසය "බොහෝ දුරට වාග් හරඹයක්" විය. (ආ). " ජාත්‍යන්තරවාදය ට්‍රොට්ස්කිගේ අරමුන සඳහා කෙන්ද්‍රීය කරුනක් බවට පත් වූයේ 1933 දී ඔහු පිටුවාහලට පත්වූ පසු පමනි." (උ) තනි රටක සමාජවාදය ගොඩනැගීමේ හැකියාව සම්බන්ධව ට්‍රොට්ස්කි ස්ටැලින් හා එකඟ විය. තමා වැඩි යමක් නොදැන සිටි විෂයයන් පිලිබඳව ලියන්නට ට්‍රොට්ස්කි සැම විටම කැමති වූයේ ය. සහ (එ) ට්‍රොට්ස්කිට යුරෝපීය දේශපාලනය පිලිබඳ "මොනයම් හෝ වැටහීමක් පරම වසයෙන් ම තිබුනේ නැත. මේ ඉහත සඳහන් ප්‍රකාශයන් එකක් හෝ පමනක් නොව මට අවධානය දැක්විය හැකි ඔබේ තවත් බොහෝ ප්‍රකාශ කිසි සේත් ම ට්‍රොට්ස්කිගේ යෝධ දේශපාලන ලිපිලේඛන ද ඔහුගේ දේශපාලන වැඩ පිලිබඳ වෛෂයික වාර්තාව ද පරීක්ෂා කිරීම මගින් නම් කිසිසේත් ම සාධනය කල හැකි නොවේ.

ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ ජේම්ස් වයිට් නම් මහාචාර්ය වරයා සමග ඔබේ වෘත්තිමය සම්බන්ධතාවයේ ප්‍රමානය පිලිබඳව කෙරෙන පැහැදිලි කිරීමකට සීමාවන ඔබ ඔබගේ කෘතියේ බරපතල බැරෑරුම් දෝෂයන් පිලිබඳව මවිසින් කැරුනු එලිදරව් කිරීම් එකකකට වත් පිලිතුරක් දෙන්නේ නැත. ඒ වෙනුවට ඔබ කරන්නේ මෙම චරිතාපදානය ලිවීමේ දී ඔබ යොදා ගත් ප්‍රවිෂ්ටය නීර්නය කලා වූ උත්සුකයන් පැහැදිලි කිරීමට උත්සාහ කිරීම පමනි. ඒ අනුව ඔබ උත්සාහ කර ඇත්තේ "එකිනෙකට වෙනස් ට්‍රොට්ස්කිලා දෙන්නෙක්" ඇත්ත වසයෙන් ඔබ 1917ට පෙර සහ පසු යන දෙසමයේ ම ට්‍රොට්ස්කිගේ ලිපි ක්‍රමානුකූලව හැදෑරීමකට කාලය යොදා ගත්තා නම් හිටියේ එක ට්‍රොට්ස්කි කෙනෙක් පමනක් බව ඉගෙනගැනීමට ඔබට හැකි වන්නට ඉඩ තිබුනි. අතිමහත් දුෂ්කරතාවයන් මැද්දේ පවත්වා ගෙන යනු ලැබූ ට්‍රොට්ස්කිගේ දේශපාලන චර්යාව තුල ඔහුගේ වැඩ කටයුතුවලට නොනවතින විප්ලව න්‍යාය විසින් අත්‍යසමාන්‍ය වූ ප්‍රමානයක ක්‍රියා මාර්ගික ස්ථාවර බවක් හා අඛන්ඩ භාවයක් අත් කර දෙන ලදී. 1905 විප්ලවයේ කාල පරිච්ඡේදයේ දී ට්‍රොට්ස්කි විස්තාරනය කල ලෝක සමාජවාදී විප්ලවය පිලිබඳ සංකල්පය ද එම ඓතිහාසික සන්තතිය තුල රුසියාවට අයත් වූ තැන ද යන මේ දේ 1940 දී ඔහු ඝාතනය කිරීම දක්වා ම ට්‍රොට්ස්කිගේ දේශපාලන ක්‍රියාකාරී පදනම ලෙස පැවතියේ ය.

ඔබ "වෙනස් වූ ට්‍රොට්ස්කිලා දෙන්නෙක්" සෙවීමට උත්සාහ දරා තිබේ. එසේ ම ඔබට "වෙනස්වූ ලෙනින්ලා දෙන්නෙක්" සෙවීමට ද ඉඩ තිබුනි. එනම් "කම්කරුවන් සහ ගොවීන්ගේ ඒකාධිපතිත්වය" නමැති තමාගේ ම, න්‍යාය දරාගෙන 1917 ට්‍රොට්ස්කිට විරුද්ධ වූ ලෙනින් සහ 1917 දී ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය පිලිගනිමින් "ට්‍රොට්ස්කිට වඩා හොඳ බොල්ශෙවිකයෙක් ඇත්තේ නැත" යි ප්‍රකාශ කල, සෝවියට් ආන්ඩුවේ නායකත්වය තම පැරනි එදිරිවාදියාට බාරදීමට සූදානම් වූ (මේ වනාහී ට්‍රොට්ස්කි ප්‍රතික්ෂේප කල ගෞරවයකි) පසු කාලීන ලෙනින් ය.

1917 ඔක්තෝබරයට පෙර මේ මිනිසුන් දෙදෙනා ප්‍රාසක්තව සිටි ක්‍රියා මාර්ගය සහ ඉදිරි දර්ශනය පිලිබඳ ප්‍රශ්නවලින් වෙන් කොට මේ මිනිසුන් දෙදෙනාගේ දේශපාලන වර්ධනය ද ඔවුන් අතර වූ සංකීර්න සම්බන්ධතාවය ද වටහා ගත නොහැකි ය. කනගාටුවට හේතුවක් වන්නේ ඔබ විසින් ලියා ඇති චරිතාපදානය එක්කෝ මෙම ප්‍රශ්න නොතකා හැරීම ය නැතහොත් විකෘත කිරීම ය. ඉතිහාසය මෙසේ ඉදිරිපත් කිරීමේ අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ මා මගේ සමාලෝචනයේ විදහා දැක්වූ පරිදි මුසාකරනය වූ ස්ටැලින්වාදී වර්තනයට සමීප වන්නා වූ ඉතිහාස රචනයකි.

මෙම ප්‍රවනතාවය ඔබගේ ලිපිය තුල දිගින් දිගට ම පවතී. උදාහරනයක් හැටියට දැන් ඔබ මෙසේ ලියන්නෙහි ය. "ට්‍රොට්ස්කිගේ 1917ට පෙර පැවති මෙන්ශෙවික්වාදය නායකත්වය සඳහා ඔහු එල්ල කල අභියෝගය දුබල කලේ ය." ට්‍රොට්ස්කිගේ දේශපාලන චරිතාපදානයේ ස්ටැලින්වාදී මුසාකරනය හැර මෙම ප්‍රකාශය පදනම් වී ඇත්තේ වෙන කුමක් මත ද? ට්‍රොට්ස්කි මෙන්ශෙවික් වාදියකුව සිටියේ නැත. 1903 සැප්තැම්බරයේ දී රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ (ආර්එස්ඩීඑල්පී) දෙවන සම්මේලනයේ ඇති වූ භේදයෙන් ක්ෂනික ඉක්බිත්තේ කෙටි කාලයකට හැරෙන්නට ට්‍රොට්ස්කි සිටියේ බොල්ශෙවික් සහ මෙන්ශෙවික් කන්ඩායම් දෙකට ම එරෙහිව ය. ට්‍රොට්ස්කිගේ ආස්ථානයේ පදනම වූයේ රුසියානු විප්ලවවාදී ව්‍යාපාරයේ ධාවක බලවේගයන් ද ගමන් මග ද පිලිබඳ ඔහුගේ සංකල්පය යි; මෙම සංකල්පය බොල්ෂෙවික් වරුන්ගේ මෙන්ම මෙන්ෂෙවික් වරුන්ගේ සංකල්පයන්ට ද වෙනස් විය. ලෙනින්ගේ ආස්ථානයෙන් ගත් කල්හි ට්‍රොට්ස්කිගේ වැරැද්ද වූයේ ආර්එස්ඩීඑල්පීයේ ප්‍රතිවිරුද්ධ කන්ඩායම් සමහන් කිරීමට ඔහු දැරූ උත්සාහය යි. එනම් ට්‍රොට්ස්කි පක්ෂ සංවිධානය සම්බන්ධ ප්‍රශ්නයේ දී "මාධ්‍යමික" ආස්ථානයක් දරා සිටීමයි. පසුකලෙක 1920 ගනන්වල දී ඔහුගේ කන්ඩායම්වාදී විරුද්ධවාදීන් ට්‍රොට්ස්කිගේ " මෙන්ශෙවික්වාදය" හෙලාදැකීම ඔවුන් විසින් ඉතිහාසය මුසාකරනය කිරීමේ කේන්ද්‍රීය අංගයක් විය.

ට්‍රොට්ස්කිගේ දේශපාලන චර්යාව අර්ථකථනය කිරීමේ දී ඔබට අත්තිවාරම සපයන්නේ මෙම මුසාකරනය යි.

ඔබ විසින් ලියා ඇති චරිතාපදානයේ අවසාන පරිච්ඡේදයේ පහත සඳහන් ඡේදය හමුවේ. " ඔවුනොවුන් ප්‍රතිමුඛ වූ එක් අවසාන අවස්ථාවක දී 1927 සැප්තැම්බර් මස 27 වෙනි දින කොමින්ටර්නයේ විධායක කමිටු රැස්වීමක දී ස්ටැලින් තම කථාව අවසන් කලේ ට්‍රොට්ස්කිගේ මූනට ම මෙසේ චෝදනා කරමිනිඃ

"ඔබ මෙන්ශෙවික්වාදියෙකි! ට්‍රොට්ස්කි කවදාක්වත් බොල්ශෙවික්වාදියෙක් වූයේ ද?" ඉක්බිති ඔබ මෙසේ පිලිතුරු දුන්නෙහි ය, "ට්‍රොට්ස්කි බොල්ශෙවික්වාදයට එරෙහි වීම පිලිබඳ චෝදනාව ඒත්තුගන්වනසුලු වේ." (පිටුව 214) කාටද, ස්වේන් මහාචාර්ය වරය ඒත්තුගන්වනසුලු? සහතිකෙන්ම බොල්ශෙවික්වාදයේ න්‍යායික හා ක්‍රියා මාර්ගික පදනම් දන්නා කියන අයට නම් නො වේ. අපට තෝරා බේරා ගැනීමට හැකිවන ප්‍රමානයට නම් ඔබ බොල්ශෙවික්වාදය සංකල්පනය කර ගන්නේ මුලුමනින්ම වියුක්ත වූ ව්‍යුහීය අර්ථයකිනි. දේශපාලන අන්තර්ගතයකින් තොර ග්‍රස්ත ලෙස විනයගත වූ සුපිරි කේන්ද්‍රීයකරනයකින් යුතු දේශපාලන සංවිධානයක් හැටියට ය. සාරභූතලෙසින්ම ස්ටැලින්වාදී වූද නිලධාරිවාදී වූද මෙම සංකල්පය බොල්ශෙවික්වාදය නිර්වචනය කලා වූද එහි විවිධ වූ සංවිධානාත්මක රූපයන් නීර්නය කලා වූද ක්‍රියා මාර්ගික ප්‍රයුක්තීන් නොතකා හරියිඃ බොල්ශෙවික්වාදීන් මෙන්ශෙවික්වාදීන්ගෙන් වෙන් කල සාරභූත දේශපාලන ප්‍රයුක්තිය වනාහී රුසියාවේ ලිබරල් ධනේශ්වරය පිලිබඳව ඔවුන්ගේ ප්‍රතිවිරුද්ධ ඇගයීම් ය. ලෙනින් ලිබරල් ධනේශ්වරයට එරෙහිව කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනතාවය තහවුරු කිරීම සඳහා අප්‍රතිහතව සටන්වැදුනේ ය; 1905 විප්ලවයෙන් පසුව මෙන්ශෙවිකයෝ ස්ථිරසාරව ම ලිබරල් ධනේශ්වරයට සමීප වී ගත්තාහ. 1914 ලෝක යුද්ධය පුපුරා හැරීම යුරෝපීය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ පෘථුල ප්‍රවනතාවයන් පිලිබිඹු කල මෙන්ශෙවික්වාදය ලිබරල් ධනේශ්වරය සමග පෙල ගැසෙමින් රුසියානු රාජ්‍යය සහ එහි ජාතික සහ අධිරාජ්‍යවාදී ආසක්තයන් ආරක්ෂා කිරීමට යෙදී ගත් කල්හි මෙම සට්ටනය තවත් උග්‍ර විය. පලමුවන ලෝක යුද්ධයේ පුපුරා යාමත් සමග දෙවන ජාත්‍යන්තරයේ පක්ෂ තුල ජනනය කරන ලද ජාත්‍යන්තර අර්බුදය සහ ක්‍රියාමාර්ගයේ ආස්ථානයෙන් විග්‍රහ කරනු ලැබූ කල්හි පමනකි 1917 දී ලෙනින් සහ ට්‍රොට්ස්කි අතර ඇති කර ගන්නා ලද සම්බන්ධතාවයට යටින් පැවති තර්කනය වටහා ගත හැක්කේ. දෙවන ජාත්‍යන්තරය බිඳ වැටීම ද මෙන්ශෙවික්වාදය රුසියානු අධිරාජ්‍යවාදයේ උපකරනයක් දක්වා පිරිහීම ද යන මේ කරුනු පැරනි අර්එස්ඩීඑල්පීය තුල ජාත්‍යන්තර විප්ලවවාදී ප්‍රවනතාවය ද ජාතික ප්‍රතිසංස්කරනවාදී අවස්ථාවාදය ද අතර දේශපාලන එකඟතාවයක් ඇති කල නොහැකිය යන්න වටහා ගැනීමට ට්‍රොට්ස්කි මෙහෙයවී ය. මේ අතර ලෙනින් මෙන්ශෙවික්වාදීන් විසින් ම ඉදිරිපත් කරන ලද්දා වූ ධනේශ්වර තාවකාලික ආන්ඩුව සමග පන්ති සහයෝගිතාවයට එලඹීමේ පිලිවෙතට එරෙහි එකම විකල්පය වූයේ නොනවතින විප්ලව න්‍යායේ ඉදිරි දර්ශනය යයි වටහා ගත්තේය.

දේශපාලන ප්‍රවනතාවයක් හැටියට මෙන්ශෙවික්වාදයේ ජාතික ප්‍රතිසංස්කරනවාදී ද එහෙයින් ම ප්‍රති-ට්‍රොට්ස්කිවාදී වූද ස්වභාවය නොතකා හරින ඔබ 1927 දී ට්‍රොට්ස්කිට විරුද්ධව ස්ටැලින්ගේ ප්‍රකෝපකාරී හා නරුම පුපුරා හැලීම - ඒ පිලිබඳව දේශපාලන තක්සේරුවක් කිරීම පසෙක තබා - උපුටා දක්වන්නේ හරියට ම එය කිසියම් වර්ගයක වීරෝදාර ප්‍රති උත්තරයක්වූවාක් මෙනි. ("ට්‍රොට්ස්කිට ට්‍රොට්ස්කිගේ මූනට ම ...") මේ වන විටත් ස්ටැලින්වාදී නිලධරය තුන්වන ජාත්‍යන්තරය (කොමින්ටර්නය) තුල සිටි සියලු ස්වාධීන දේශපාලන පුද්ගලයන් අතුගා දමා එ වෙනුවට අදක්ෂ පන්දම් කාරයන් රොත්තක් පුරවා ගෙන සිටි බව සඳහන් කිරීමට ඔබ අසමත්වන්නෙහි ය. එසේම ඔබ අමතක කරන තවත් කරුනක් නම් ජාතික සහ ජාත්‍යන්තර ප්‍රශ්නයන්හිලා විශේෂයෙන්ම චීන විප්ලවයේ දී ස්ටැලින්ම අනුගමනය කල පිලිවෙත් ඔක්තෝබරයට පෙර මෙන්ශෙවික්වාදයට අතිශයින්ම සම වූ බවයි. අවසාන වසයෙන් ඔබ නොතකා හරින කරුනක් නම් ස්ටැලින්ගේ එම පුපුරා හැලීම සිදු වූයේ ට්‍රොට්ස්කි පමනක් නොව පැරනි බොල්ශෙවික් පක්ෂයේ අතිශයින් ම ප්‍රමුඛවූ සාමාජිකයන් දුසිම් ගනනාවක් (සමහරෙකුගේ නම් සඳහන් කලොත් සිනොවියෙව්, කමනෙව්, පියැටකොව්, ප්‍රියොබ්‍රෙෂෙන්ස්කි, වොරොන්ස්කි, ටර්-වගානියන් සහ ස්මිර්නොව්) පලවාහැරීමට සැරසෙමින් සිටි බව ය. ඔබ කොයි තරම් නැතැයි කීවත් මෙය නම් ස්ටැලින් ආරක්ෂා කිරීමකි.

එසේම ඔබේ ලියුම ආරක්ෂා කරන තවත් කරුනක් නම් "තර්මිඩෝරය යථාර්ථය තුල මුල් බැසගත්තා වූ සංකල්පයක් නුවූ බවයි. ප්‍රන්ස විප්ලවයෙන් උකහා ගත්තා වූ අත්දැකීම් තුලින් වර්ධනය කර ගන්නා ලද මෙම සංකල්පය අවුරුදු ගනනාවක් තිස්සේ ට්‍රොට්ස්කි තවතවත් මුවහත් කර ගත්තේ ය. තර්මිඩෝරය පෙන්නුම් කලේ විප්ලවය විසින් නිර්මානය කරන ලද රාජ්‍ය තන්ත්‍රය දකුනට පනිමින් සලකුනු කල දේශපාලන විභේද අවස්ථාවකි. ඔබ විසින් මෙම සංකල්පය ඉවතට දැමීම පෙන්නුම් කරන්නේ ස්ටැලින්වාදී තන්ත්‍රය ඔක්තෝබර් විප්ලවයට එරෙහි දේශපාලන ප්‍රතිගමනයක නිෂ්පාදනය වූ බවත් එය කම්කරු පන්තියේ (විශේෂයෙන්ම ජර්මනියේ) ජාත්‍යන්තර පරාජයන්හි තුල ද සෝවියට් රුසියාවේ දිග් ගැසුනු හුදෙකලාභාවය තුලද ය යන ට්‍රොට්ස්කිගේ

අර්ථකථනයන් පදනම් විරහිත බව ය. වෙනත් වචනවලින් කිවහොත් ස්ටැලින්වාදය නියෝජනය කලේ දකුනට ගමන් කිරීමක් නොවේ. එසේ නම් ට්‍රොට්ස්කි සටන් වැදුනේ කුමකට විරුද්ධව ද? ඔබ විසින් රචිත චරිතාපදානය මෙම තීරනාත්මක ප්‍රශ්නයට පිලිතුරක් සපයන්නේ නැත.

අවසාන වශයෙන් මෙහිදී එක් කරුනක් සඳහන් කිරීමට කැමැත්තෙමි. ඔබගේ ප්‍රකාශකයාගේ "බලයේ පැතිකඩ" ප්‍රකාශන මාලාවේ අවශ්‍යතා විසින් ඔබගේ පොත ට්‍රොට්ස්කි සෝවියට් සංගමය තුල අධිපති බලය ඉසිලූ එම අවුරුදුවලට සංකේන්ද්‍රනය විය යුතු යයි යොමුකල බව ඔබ කියා සිටින්නෙහි ය. සමහර විට එසේ විය හැකිය. එහෙත් ට්‍රොට්ස්කි දරාසිටි අධිකාරය රඳා තිබුනේ අන් සියල්ලටමත් වඩා මනසේ සහ අදහස්වල බලය මතය. ඔහුගේ මරනයට අවුරුදු 70ක් ගතවූ පසු තාමත් ට්‍රොට්ස්කි ලිපි ලේඛන ජාත්‍යන්තර ශ්‍රාවකයක් මත අධිකාරය දරා සිටී. ඔහුගේ නම හා සම්බන්ධවූ විප්ලවවාදී ක්‍රියාමාර්ගය ලෝකය පුරාම සමාජවාදී ව්‍යාපාරවලට ආස්වාදය සපයමින් පවතී. ට්‍රොට්ස්කි පිලිබඳ චරිතාපදානයක් විසින් මෙයට හේතුව පැහැදිලි කරමින් මෙම විරල වර්ගයේ අධිකාරයට යටින් පැවති බුද්ධිමය ගුනයන් ඊට උචිත පරීක්ෂා කාරී බවකින් යුතුව විග්‍රහ කල යුතුව තිබුනි.

ඩේවිඩ් නෝර්ත්.

2007 මැයි 17

© www.wsws.org